සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

45 | S | II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය**
**Grade 13**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**
**Buddhist Civilization - II**

**පැය තුනයි**
**Three hours**

**සැලකිය යුතුයි :**

- **I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 කි. 1, 2, 3 ප්‍රශ්නවලින් එක් කොටසකට ලකුණු 4 බැගින් ද, (4), (5), (6), (7), (8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

## I කොටස

(01) i. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව චතුර් වර්ණයේ ප්‍රභවය සිදු වූ ආකාරය ගෙනහැර දක්වන්න.

ii. චතුර්විධ ආශ්‍රම ධර්ම හඳුන්වා දෙන්න.

iii. බුද්ධ කාලීන කෝසල රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iv. බුදුරජාණන් වහන්සේ පිළිබඳ ප්‍රකට නූතන ඇගයීම් දෙකක් ගෙනහැර දක්වන්න.

v. බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යාඥාන කෙටියෙන් හඳුන්වන්න.

(02) i. ශාසනික උන්නතිය සඳහා සැරියුත් මහරහතන් වහන්සේගෙන් සිදු වූ සේවය සැකෙවින් දක්වන්න.

ii. ආකාරවතී ශ්‍රද්ධාව හඳුන්වා දෙන්න.

iii. සප්ත අපරිහානීය ධර්ම නම් කරන්න.

iv. සිගාලෝවාද සූත්‍රයේ දකුණු දිසාවෙන් නියෝජනය වන යුතුකම් හා වගකීම් නම් කරන්න.

v. සතර බ්‍රහ්ම විහරණ අතර ''කරුණා' බ්‍රහ්ම විහරණයේ වැදගත්කම සැකෙවින් හඳුන්වන්න.

(03) i. ''අප්පමාදේන මඝවා'' යනාදී ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ තේරුම නිවැරදිව ලියන්න.

iii. අටසිල් පිළිවෙලින් නම් කරන්න.

iv. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව ගෙනහැර දක්වන්න.

v. මෙලොව ජීවිතයේ සාර්ථකත්වය සඳහා සමජීවිකතාවය උපයෝගී වන ආකාරය ධර්මානුකූලව විස්තර කරන්න.

## II කොටස

(04) i. ස්වධර්ම සංකල්පය පිළිබඳ බ්‍රාහ්මණ මතය විස්තර කරන්න.

ii. බුදු දහමින් කාන්තාව, බිරිඳක, මවක, උපාසිකාවක, ලෙස ලද නිදහස අගය කරන්න.

(05) i. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ශුද්‍ර වංශිකයන්ගේ ආගමික, සාමාජික, අධ්‍යාපනික, ආර්ථික අයිතිවාසිකම් උල්ලංඝනය වූ ආකාරය විමර්ශනය කරන්න.

ii. බුද්ධ කාලීන භාරතයෙහි කෘෂිආර්ථික ජීවන රටාවක් පැවතියේ දැයි පරීක්ෂා කරන්න.

(06) i. සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගල ජීවිතයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ඉවහල් කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

ii. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සේව්‍ය සේවක යුතුකම් තුළින් සේවා ආයතනවල පැනනගින අර්බුධ නිරාකරණය කරගත හැකි දැයි පරීක්ෂා කරන්න.

(07) i. ප්‍රථම ධර්ම සංගීතිය පැවැත්වීම සඳහා බලපාන ලද හේතු මොනවාදැයි සාකච්ඡා කරන්න.

ii. ධර්ම විනයෙහි සුරක්ෂිත බව සඳහා එම සංගීතියේ දී ගනු ලැබූ තීරණ හේතු වූයේ දැයි පරීක්ෂා කරන්න.

(08) i. ''ධර්මාශෝක අධිරාජයා බෞද්ධ නරපතියෙකි.'' මෙම කියමන විමර්ශනය කරන්න.

ii. නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය සාර්ථක වීම සඳහා බලපාන ලද කරුණු සාකච්ඡා කරන්න.